11963

AL/2020/28/S-I(NEW)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

(නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus)

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020**
**General Certificate of Education (Adv. Level) Examination, 2020**

| | | | |
|---|---|---|---|
| ගෘහ ආර්ථික විද්‍යාව I<br>மனைப் பொருளியல் I<br>Home Economics I | 28 S I | | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>Two hours |

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

**1.** 'අක්වක් රේඛා' සහ 'විකර්ණාකාර රේඛා' නිර්මාණකරණයේ මූලිකාංගයක් වන රේඛාවල ආකාර දෙකකි. මෙම රේඛා දෙකෙන්ම පිළිබිඹු කරන හැඟීම් වන්නේ,
(1) ක්‍රියාශීලී බව සහ චලනයයි. (2) චලනය සහ නොසන්සුන් බවයි.
(3) කලබලකාරී බව සහ ක්‍රියාශීලී බවයි. (4) රිද්මයානුකූල බව සහ කලබලකාරී බවයි.
(5) නොසන්සුන් බව සහ රිද්මයානුකූල බවයි.

**2.** ගෘහයන් කිහිපයක් නිරීක්ෂණය කිරීමෙන් පසුව ඉදිරිපත් කරන ලද පහත ප්‍රකාශ සලකන්න. ඒ අතුරෙන්, ගෘහ නිර්මාණය හෝ අලංකරණය පිළිබඳ වඩාත්ම සුදුසු ප්‍රකාශය කුමක් ද?
(1) වහලය හා සිවිලිම ඇස්බැස්ටස්වලින් නිමකර තිබීම.
(2) විසිත්ත කාමරයක බිත්තිවල විශාල, වර්ණවත් පින්තූර එල්ලා තිබීම.
(3) කුඩා විසිත්ත කාමරයක ගෘහභාණ්ඩ ආවරණ සඳහා තදපැහැ රෙදි තෝරා ගැනීම.
(4) විසිත්ත කාමරයේ දිග ජනෙල් සඳහා දුහුල් ලේස්වලින් නිම වූ තිරරෙදි යොදා තිබීම.
(5) මුළුතැන්ගෙයි බිමට කැටයම් සහිත, ගොරෝසු මතුපිටක් සහිත බිම් ගඩොල් යොදා තිබීම.

**3.** පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.
(1) සුදු පැහැය මිශ්‍ර කිරීමෙන් වර්ණයක වටිනාකම වැඩිකරගත හැකිය.
(2) අභ්‍යන්තර අවකාශ නිර්මාණය, භෞතික ජීවන පරිසරයෙහි කොටසකි.
(3) දෘශ්‍ය බර සහ ප්‍රමාණය, නිර්මාණයක සමානුපාතික බව තීරණය කරනු ලබන සාධක දෙක වේ.
(4) සමමිතික හෝ අසමමිතික තුලනයට අනුව නිවසේ ගෘහ භාණ්ඩ සහ උපාංග ස්ථානගත කළ හැකිය.
(5) ගොඩනැගිලි නිර්මාණකරණයට පෙර, එම පරිසරයෙහි සංවර්ධන ව්‍යාපෘති පිළිබඳව අධ්‍යයනය කිරීම වැදගත්ය.

**4.** පහත දැක්වෙන කරුණු අතුරෙන් බාහිර අවකාශ නිර්මාණකරණය සම්බන්ධව නිවැරදි වන්නේ,
(1) කුඩා ගෙවත්තක විශාල ගස් රෝපණය කිරීම ය.
(2) ගෙවත්තෙහි ගමන් කිරීම සඳහා සෑමවිටම සෘජු ගමන්මාර්ග සකසා ගැනීම ය.
(3) ඕනෑම භූමියක් අලංකරණයට පොකුණු, පාලම්, දිය ඇලි ආදී උපාංග භාවිත කිරීම ය.
(4) සුමට භූ දර්ශනයක් ඇතිකර ගැනීම සඳහා ඔප දමන ලද ප්‍රතිමා කිහිපයක් ඉදි කිරීම ය.
(5) ගොඩනැගිල්ලෙන් ඉටුවන කාර්යය පිළිබිඹු වන සේ බාහිර පරිසරය නිර්මාණය කිරීම ය.

**5.** මොනොසැකරයිඩ දෙකක් වන්නේ,
(1) ග්ලූකෝස් සහ මෝල්ටෝස් ය. (2) ග්ලයිකොජන් සහ ෆෲක්ටෝස් ය.
(3) ගැලැක්ටෝස් සහ ෆෲක්ටෝස් ය. (4) ගැලැක්ටෝස් සහ මෝල්ටෝස් ය.
(5) ග්ලූකෝස් සහ ග්ලයිකොජන් ය.

[දෙවැනි පිටුව බලන්න

**6.** ප්‍රෝටීන හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) ප්‍රෝටීනවල ත්‍රිමාණ ව්‍යුහය වෙනස්වීම කෙරෙහි සාන්ද්‍ර ලවණ බලපෑමක් ඇති නොකරයි.
(2) ධාන්‍ය වර්ග කිහිපයක් මිශ්‍ර කර ආහාර සැකසීම මගින් ප්‍රෝටීන පරිපූරණය සිදු වේ.
(3) ශරීරයේ ප්‍රතිශක්තිකරණය සඳහා වැදගත් වන ප්‍රතිදේහවල ප්‍රෝටීනමය සම්භවයක් නොමැත.
(4) ඇක්ටින් සහ මයොසින්, පේශි ක්‍රියාකාරීත්වය කෙරෙහි වැදගත් වන ප්‍රෝටීනමය සංයෝග දෙකකි.
(5) ප්‍රෝටීනවල ව්‍යුහයෙහි කාබන්, හයිඩ්‍රජන්, ඔක්සිජන්, නයිට්‍රජන් සහ සල්ෆර් යන මූලද්‍රව්‍ය අනිවාර්යයෙන් අඩංගු වේ.

**7.** පහත සඳහන් විටමින් අතුරෙන් සත්ත්ව ආහාරවල පමණක් අඩංගු විටමිනය කුමක් ද?
(1) නියසින් ($B_3$)
(2) පිරිඩොක්සින් ($B_6$)
(3) රයිබොෆ්ලේවින් ($B_2$)
(4) ෆෝලික් අම්ලය ($B_9$)
(5) සයනොකොබැලමින් ($B_{12}$)

**8.** ලිපිඩ අඩංගු වන හෝර්මෝන දෙකකි,
(1) කෝටිසෝන් සහ ඊස්ට්‍රජන්.
(2) ඊස්ට්‍රජන් සහ තයිරොක්සින්.
(3) කෝටිසෝන් සහ ඉන්සියුලින්.
(4) ටෙස්ටොස්ටෙරෝන් සහ ඉන්සියුලින්.
(5) තයිරොක්සින් සහ ටෙස්ටොස්ටෙරෝන්.

**9.** විවිධ කාණ්ඩවලට අයත් ආහාර පිළිබඳ සත්‍ය ප්‍රකාශය මින් කුමක් ද?
(1) මාළු හා කරවලවල අධික සංතෘප්ත මේද ප්‍රමාණයක් අඩංගු වේ.
(2) කිරිවල ඇති ලැක්ටෝස්, දත් දිරායෑමට ප්‍රධාන හේතුව වේ.
(3) පැහීමේදී නිවුඩ්ඩ ඉවත්වීම සියලුම සහල් වර්ගවල විටමින් හා ඛනිජ ලවණ ඉවත් වීමට හේතුවේ.
(4) එළවළුවල අඩංගු තන්තු මගින් ශරීරයට කොලෙස්ටරෝල් අවශෝෂණය වීම අඩු කරයි.
(5) සත්ත්වමය ප්‍රෝටීන අතුරෙන් බිත්තර සුදු මදයෙහි ඇති ප්‍රෝටීනවල ජෛව විද්‍යාත්මක අගය අඩු ය.

**10.** ශ්‍රී ලංකාවේ බහුලව දැකිය හැකි ඌනතා සඳහා හේතුවන ක්ෂුද්‍ර පෝෂක වන්නේ,
(1) යකඩ, විටමින් A , අයඩින් සහ සින්ක් ය.
(2) අයඩින්, විටමින් A , පොස්පරස් සහ සින්ක් ය.
(3) සින්ක්, විටමින් K , අයඩින් සහ සෙලනියම් ය.
(4) සෙලනියම්, විටමින් A , යකඩ සහ පොස්පරස් ය.
(5) පොස්පරස්, විටමින් K , සෙලනියම් සහ යකඩ ය.

**11.** ආහාර ජීරණ ක්‍රියාවලිය පිළිබඳ සත්‍ය ප්‍රකාශය වන්නේ මින් කුමක් ද?
(1) ආහාරයේ අඩංගු සුක්‍රෝස් ජීර්ණය මුඛයෙන් ආරම්භ වේ.
(2) ආමාශයික යුෂයේ ට්‍රිප්සීන් එන්සයිමය අඩංගු වේ.
(3) ලිපිඩ තෛලෝදකරණය සඳහා පිත්යුෂ වැදගත් වේ.
(4) ලයිපේස් එන්සයිමය ක්‍රියා කිරීම සඳහා අවශ්‍ය pH අගය 3 පමණ වේ.
(5) ආහාරයේ අඩංගු ප්‍රෝටීන ජීර්ණය ආරම්භ වන්නේ ක්ෂුද්‍රාන්ත්‍රය තුළදී ය.

**12.** පහත කරුණු සලකන්න.

A - කැෆේන් අඩංගු පාන වර්ග ගැනීම.
B - විටමින් D බහුල ආහාර ගැනීම.
C - ද්‍රාව්‍ය තන්තු සහිත ආහාර ගැනීම.
D - ෆයිටික් අම්ලය අඩංගු ආහාර ගැනීම.

මේවා අතරින් කැල්සියම් හා මැග්නීසියම් සිරුරට අවශෝෂණය කිරීම කෙරෙහි **අහිතකර** ලෙස බලපාන කරුණු වන්නේ,
(1) A සහ B පමණි.
(2) A සහ D පමණි.
(3) B සහ C පමණි.
(4) B සහ D පමණි.
(5) C සහ D පමණි.

**13.** මන්දපෝෂණ තත්ත්ව වන ක්වෝෂියෝර්කෝර් සහ මැරස්මස් පිළිබඳව නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) මුහුණ, උදරය සහ පාද ඉදිමීම, මැරස්මස් තත්ත්වයේ ප්‍රධාන රෝග ලක්ෂණ වේ.
(2) ක්වෝෂියෝර්කෝර් සහ මැරස්මස් යන තත්ත්ව දෙකම එකවර ඇතිවිය හැකි ය.
(3) ආහාරයෙන් දරුවාට ලැබෙන ප්‍රෝටීන ප්‍රමාණය අඩුවීමෙන් මැරස්මස් තත්ත්වය ඇති වේ.
(4) වයස අවුරුදු එකහාමාරට අඩු දරුවන් අතර ක්වෝෂියෝර්කෝර් වැළඳීමේ ප්‍රවණතාව වැඩි ය.
(5) ශ්‍රී ලංකාවේ ජනාකීර්ණ නාගරික ප්‍රදේශවල දරුවන් අතර ක්වෝෂියෝර්කෝර් රෝගය සුලභව දක්නට ලැබේ.

[තුන්වැනි පිටුව බලන්න

**14.** ආහාරවේල් සැලසුම් කිරීමේදී උපයෝගී කරගන්නා ආහාර පිරමීඩය සහ ආහාර පිඟාන පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) ආහාර පිඟානෙහි තුනෙන් පංගුවක් එළවළු හා පළා වර්ග විය යුතු ය.
(2) ආහාර පිරමීඩය ශ්‍රී ලංකාවට නොගැළපෙන බැවින් ආහාර පිඟාන හඳුන්වා දී ඇත.
(3) දෛනිකව ගනු ලබන සියලුම ප්‍රධාන සහ සුළු ආහාර වේල්වලට කිරි ආහාර ඇතුළත් කළ යුතු ය.
(4) ආහාර පිරමීඩය සහ ආහාර පිඟාන මගින් පුද්ගලයකුගේ දෛනික ආහාර වේලක් නිරූපණය කරයි.
(5) දිනකට ගතයුතු සත්ත්වමය ආහාර ප්‍රමාණ (servings) ආහාර පිරමීඩයේ එක් කොටසකින් දක්වා ඇත.

**15.** ස්ථූලතාව පාලනය සඳහා ගත හැකි නිවැරදි ක්‍රියාමාර්ගයක් වන්නේ,

(1) දෛනික ආහාර වේල් මඟහැර සිටීමයි.
(2) ප්‍රෝටීන බහුල ආහාර වැඩිපුර ගැනීමයි.
(3) ආහාර ගැනීමට පෙර ජලය පානය කිරීමයි.
(4) බත්වලට ආදේශකයක් ලෙස අල වර්ග භාවිතයයි.
(5) දෛනික ආහාරය, ප්‍රධාන ආහාර වේල්වලට පමණක් සීමා කිරීමයි.

**16.** අධිරුධිර පීඩනය සහ දියවැඩියාවෙන් පෙළෙන රෝගියකු සඳහා වඩාත් සුදුසු ආහාර වර්ග දෙකකි,

(1) පළතුරු කේක් කෑල්ලක්, මේද රහිත කිරි වීදුරුවක්.
(2) රෝස්ට් කළ මාළු කෑල්ලක්, ඇඹුල් කෙසෙල් ගෙඩියක්.
(3) මිරිසට පිසින ලද කරවල කෑල්ලක්, මිශ්‍ර එළවළු සලාදයක්.
(4) කුරක්කන් පාන් පෙත්තක්, මිශ්‍ර පළතුරු කෝඩියල් වීදුරුවක්.
(5) මේද අඩු චීස් කෑල්ලක්, තෙම්පරාදු කළ කොහිල ව්‍යාංජනයක්.

**17.** ආහාර සැකසීමේදී යොදා ගන්නා සෝඩියම් නයිට්‍රේට් කුමන ආකලන ද්‍රව්‍ය කාණ්ඩයට අයත්වේ ද?

(1) රසකාරක (2) පදම්කාරක (3) පිපුම්කාරක
(4) අම්ලකාරක (5) තෛලෝදකාරක

**18.** සන්නයනය, සංවහනය සහ විකිරණය යන තාප සංක්‍රාමණ ක්‍රම තුනම භාවිත වන පිසීමේ ක්‍රමය වන්නේ,

(1) බැදීමයි. (2) පෝච් කිරීමයි. (3) ග්‍රිල් කිරීමයි.
(4) ස්ටූ කිරීමයි. (5) හුමාලයෙන් තැම්බීමයි.

**19.** ආහාර දුඹුරුවීමේ ප්‍රතික්‍රියා පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් සත්‍ය ප්‍රකාශය කුමක් ද?

(1) මේලාඩ් ප්‍රතික්‍රියාව සඳහා එන්සයිමීය බලපෑමක් නැත.
(2) එන්සයිමීය නොවන දුඹුරු පැහැවීම කහට පිපීම ලෙස හඳුන්වනු ලැබේ.
(3) කැරමලීකරණය සඳහා කාබෝහයිඩ්‍රේට හා ප්‍රෝටීන ප්‍රතික්‍රියා කිරීම අවශ්‍ය වේ.
(4) දුඹුරු වීමේ ප්‍රතික්‍රියා සියල්ල ආහාරයේ ඇති පොලිෆීනෝල් සංයෝග නිසා සිදු වේ.
(5) බේකරි නිෂ්පාදනවල බිත්තර සාරු ආලේප කර පිළිස්සීමෙන් ඇතිවන දුඹුරු පැහැවීම එන්සයිමීය ප්‍රතික්‍රියාවකි.

**20.** ආහාර නරක්වීමට හේතුවන ක්ෂුද්‍ර ජීවීන් මෙන්ම ජීවායේ බීජාණු ද විනාශ කරන තාප ප්‍රතිකාරක ක්‍රමයක් වන්නේ,

(1) බිලාන්චීකරණයයි. (2) ජීවානුහරණයයි.
(3) පිසීම/උණු කිරීමයි. (4) පහළ උෂ්ණත්ව දිගු කාලීන (LTLT) පැස්චරීකරණයයි.
(5) ඉහළ උෂ්ණත්ව කෙටි කාලීන (HTST) පැස්චරීකරණයයි.

**21.** කාර්මික රෙදි භාවිත කරනු ලබන්නේ පහත සඳහන් කුමන අවස්ථාවේදී ද?


(1) කෘෂිකර්මාන්තයේදී (2) ඇඟළුම් කර්මාන්තයේදී
(3) ගොඩනැගිලි අලංකරණයේදී (4) කාර්යාල සඳහා තිරරෙදි සැකසීමේදී
(5) රෝහල්වල රෝගීන් වෙන් කිරීම සඳහා ඉස්කිරීම (Screens) සැකසීමේදී

**22.** නිමි ඇඳුම් කර්මාන්තයේදී භාවිත කරනු ලබන වාණිජ මැහුම් වර්ග තුනක් වන්නේ,

(1) අගුලු මැස්ම, වාටි මැස්ම සහ වැසුණු දම්වැල් මැස්ම ය.
(2) නැටි මැස්ම, අත් මැස්ම සහ දම්වැල් මැස්ම (තනි නූල) ය.
(3) අත් මැස්ම, අගුලු මැස්ම සහ දම්වැල් මැස්ම (තනි නූල) ය.
(4) වාටි මැස්ම, බ්ලැන්කට් මැස්ම සහ වැසුණු දම්වැල් මැස්ම ය.
(5) බ්ලැන්කට් මැස්ම, නැටි මැස්ම සහ අද්දර නිමාව සහිත දම්වැල් මැස්ම ය.

[හතරවැනි පිටුව බලන්න

**23.** කෙඳි වර්ගයක හරස්කඩෙහි අන්වීක්ෂීය පෙනුම පහත රූප සටහනෙන් දක්වා ඇත. මෙම කෙඳි වර්ගය කුමක් ද?



(1) සේද (2) ලෝම (3) ලිනන් (4) නයිලෝන් (5) පොලියෙස්ටර්


**24.** පිළිස්සීමෙන් පසු ඉතිරිවන ද්‍රව්‍ය පබළු මෙන් දිස්වන්නේ කුමන කෙඳි වර්ගයේ ද?

(1) සේද (2) ලිනන් (3) ඩෙක්‍රෝන් (4) ඇස්බැස්ටස් (5) සෙලියුලෝස්

**25.** කෙඳි වර්ගීකරණයට අනුව කෘත්‍රිම කෙඳි සඳහා උදාහරණ වන්නේ,

(1) රෙයෝන් සහ කේසීන් ය. (2) ඇරමිඩ් සහ ටෙරලීන් ය.
(3) ඕර්ලෝන් සහ කේසීන් ය. (4) ටෙරලීන් සහ ඕර්ලෝන් ය.
(5) ස්පැන්ඩෙක්ස් සහ රෙයෝන් ය.

**26.** A සහ B රූප සටහන්වලින් දැක්වෙන වියමන් ක්‍රම වනුයේ පිළිවෙළින්,



A B

(1) ජටා වියමන සහ සැටින් වියමන (2) සරල හීරි වියමන සහ රළ හීරි වියමන
(3) හරස් දාර වියමන සහ සැටින් වියමන (4) ජටා වියමන සහ රළ හීරි වියමන
(5) හරස් දාර වියමන සහ සරල හීරි වියමන

**27.** ඇඟලුම් කර්මාන්තයේදී යොදා ගන්නා ඕවර්ලොක් මැස්ම සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - රෙදිවල මෝස්තර මැසීමට භාවිත කරයි.
B - රෙදිවල අද්දර නිම කිරීමට භාවිත කරයි.
C - මැසීමේදී නූල් පොටවල් 1, 2, 3, 4, 5 යනාදි ලෙස භාවිත කළ හැකිය.
D - ක්‍රීඩා ඇඳුම්වල ඇදෙන ස්ථානවලට යොදා ගනියි.

මින් නිවැරදි ප්‍රකාශ වන්නේ,

(1) A සහ B පමණි. (2) A සහ C පමණි. (3) A සහ D පමණි.
(4) B සහ C පමණි. (5) B සහ D පමණි.

**28.** අද්‍රාව්‍ය ලෝහමය සංයෝග භාවිත කරමින් රෙද්දකට ලබාදෙන නිමාව හඳුන්වන්නේ,

(1) ජලරෝධක නිමාව ලෙස ය. (2) ගිනිරෝධක නිමාව ලෙස ය.
(3) වෙඩි නොවදින නිමාව ලෙස ය. (4) බැක්ටීරියා නාශක නිමාව ලෙස ය.
(5) රසායනික ද්‍රව්‍යවලට ඔරොත්තු දෙන නිමාව ලෙස ය.

**29.** සන්නිවේදනය පිළිබඳ නිවැරදි කරුණ කුමක් ද?

(1) ලිඛිත සන්නිවේදනයේදී ඉතා ඉක්මන් ප්‍රතිචාර ලැබේ.
(2) ලිඛිත සන්නිවේදනයේ තහවුරු කිරීමේ හැකියාව අඩු ය.
(3) වාචික සන්නිවේදනයේදී නැවත නැවත අධ්‍යයනය කිරීම පහසුය.
(4) එකඟතාව දැක්වීමට මාපට ඇඟිල්ල එසවීම අවාචික සන්නිවේදනයයි.
(5) අදහස් කෙටියෙන් ප්‍රකාශ කිරීමට සංඥා යොදා ගැනීම වාචික සන්නිවේදනයේ තිබිය යුතු අංගයකි.

**30.** පහත කරුණු සලකන්න.

A - විවිධ අවස්ථාවලට අදාළ වන ආචාරධර්ම නොවෙනස්ව පවතී.

B - සංවාද ගොඩනැගීමේදී සෑමවිටම විධිමත් ක්‍රමය අනුගමනය කළ යුතු ය.

C - ආයතනයක තොරතුරුවල රහස්‍යභාවය ආරක්ෂා කළ යුතු ය.

D - සංවාද ගොඩනැගීමේදී පොදු මාතෘකා තෝරා ගැනීම වැදගත් ය.

ඉහත කරුණු අතරින් ආචාරධර්ම හා සම්බන්ධ නිවැරදි කරුණු වන්නේ,

(1) A සහ B පමණි. (2) A සහ C පමණි. (3) A සහ D පමණි.
(4) B සහ C පමණි. (5) C සහ D පමණි.

**31.** ශ්‍රී ලංකාවේ සංචාරක ආකර්ෂණයට හේතුවන වනෝද්‍යාන සංඛ්‍යාව වන්නේ,

(1) 05 කි. (2) 10 කි. (3) 15 කි. (4) 20 කි. (5) 25 කි.

**32.** සංචාරක මෙහෙයුම් සමාගමක් විසින් මගීන් 500කින් යුත් කණ්ඩායමක් සඳහා සුඛෝපභෝගී නෞකාවකින් පැසිෆික් සාගරයේ කොරල්පර නැරඹීමට සංචාරයක් සංවිධානය කර ඇත. මෙය කුමන සංචරණ ධාරාවට අයත් ද?

(1) විකල්ප සංචරණය (2) ප්‍රයාන සංචරණය
(3) රාශිගත සංචරණය (4) පාරිසරික සංචරණය
(5) ස්වභාවධර්ම සංචරණය

**33.** පහත කරුණු සලකන්න.

A - ටෙනිස් ක්‍රීඩාවේ නියැලීම.

B - රංගන පාඨමාලාවක් හැදෑරීම.

C - ස්වයං නිර්මාණවල නියැලීම.

D - රිය පැදවීමේ අභ්‍යාසවල නිරත වීම.

මේ අතුරෙන් ප්‍රතිමෝදක ක්‍රියාකාරකම් වන්නේ,

(1) A සහ B පමණි. (2) A සහ C පමණි. (3) A සහ D පමණි.
(4) B සහ C පමණි. (5) C සහ D පමණි.

**34.** පහත ප්‍රකාශ අතුරෙන් සංචරණ පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) විවිධ භූමි දේශපාලනික කලාප තුළ සිදුවන සංචරණය කලාප අභ්‍යන්තර සංචරණයයි.
(2) යම් රටක සිටින නේවාසික පුද්ගලයින් එම රට අභ්‍යන්තරයේ සහ ඉන් පිටත සිදුකරන සංචරණය ජාතික සංචරණයයි.
(3) යම් රටක සිටින නේවාසිකයින් මෙන්ම අනේවාසිකයින් ද ආගන්තුකයින් ලෙස එම රට අභ්‍යන්තරයේ කරනු ලබන සංචරණය දේශීය සංචරණයයි.
(4) යම් රටක සිටින නේවාසික පුද්ගලයින් ආගන්තුකයින් ලෙස රට අභ්‍යන්තරයට කරනු ලබන සංචරණය අභ්‍යන්තර සංචරණයයි.
(5) යම් රටක සිටින නේවාසික සහ අනේවාසික පුද්ගලයින් එම රටෙන් පිටතට ආගන්තුකයින් ලෙස සිදුකරන සංචරණය බාහිර යොමුගත සංචරණයයි.

**35.** මානව නිර්මිත ආකර්ෂණ සඳහා උදාහරණ වන්නේ,

More Past Papers at tamilguru.lk

(1) අලංකාර දර්ශන, කෞතුකාගාර සහ රබර් වතුයි.
(2) රබර් වතු, අලංකාර දර්ශන සහ ජාතික වනෝද්‍යානයි.
(3) සංරක්ෂිත ප්‍රදේශ, තේ කර්මාන්තය සහ කෞතුකාගාරයි.
(4) අත්කම් භාණ්ඩ, තේ කර්මාන්තය සහ සංස්කෘතික උත්සවයි.
(5) සංස්කෘතික උත්සව, අත්කම් භාණ්ඩ සහ ජාතික වනෝද්‍යානයි.

**36.** සංචාරකයින් සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය කුමක් ද?

(1) සංචාරකයින් සාමාන්‍යයෙන් සති 03 ක් පමණ ශ්‍රී ලංකාව තුළ ගත කරනු ලැබේ.
(2) සංචාරකයින් වැඩි ප්‍රතිශතයක් තම දරුවන් සමග සංචාරයෙහි යෙදෙති.
(3) සංචාරකයින් බොහෝ දෙනෙක් දුර රටවල සංචරණයෙහි යෙදීමට කැමැත්තක් දක්වති.
(4) සංචාරකයින් බොහෝ දෙනෙක් පැකේජ් ටුවර්ස් (Package Tours) වලට යොමු වීමට පෙළඹී ඇත.
(5) සංචාරකයින් බොහෝ දෙනෙක් සංචරණය කරන කාලය තුළදී තම වෘත්තීය කටයුතු පිළිබඳව විමසිලිමත් වෙති.

**37.** දිනක් තුළ, නිවසක පරිභරණය කරන ලද විදුලි පහන් සහ විදුලි උපකරණ පිළිබඳ සටහනක් පහත දැක්වේ.

| විදුලි පහන්/උපකරණ | | සංඛ්‍යාව | ක්ෂමතාව | කාලය |
|---|---|---|---|---|
| (1) | විදුලි පහන් | 5 | 75 | පැය 04 |
| (2) | විදුලි ඉස්ත්‍රික්කය | 1 | 1500 | මිනිත්තු 30 |
| (3) | රයිස් කුකර් | 1 | 1000 | මිනිත්තු 30 |
| (4) | ගිල්වුම් තාපකය | 1 | 750 | මිනිත්තු 20 |

එම දිනය තුළ නිවසෙහි පරිභෝජනය කරන ලද විදුලි ඒකක ප්‍රමාණය වනුයේ ආසන්න වශයෙන්

(1) 2.0 kWh කි. (2) 2.3 kWh කි. (3) 2.6 kWh කි. (4) 3.0 kWh කි. (5) 3.2 kWh කි.

**38.** නිවාස සඳහා විදුලි සැපයුම පිළිබඳ නිවැරදි ප්‍රකාශය මින් කුමක් ද?

(1) මීටරයෙහි ඇතිවන දෝෂ, පාරිභෝගිකයින් විසින් නැවත සකසාගත යුතු ය.
(2) පේනුවලට සම්බන්ධ කිරීම සඳහා සම්මත වර්ණ යෙදූ රැහැන් භාවිත කළ යුතු වේ.
(3) අධිධාරා පරිපථ බිඳිනය විසන්ධි වූ විට විලායක කම්බියක් යොදා, නැවත සකස් කරගත යුතු ය.
(4) නිවසේ භාවිත වන සියලුම විද්‍යුත් උපකරණ සඳහා භූගත රැහැන සම්බන්ධ කිරීම අත්‍යවශ්‍ය වේ.
(5) වෙන්කරණය සහ ප්‍රධාන ස්විචය යන උපාංග දෙකම නවීන ගෘහ විදුලි පරිපථවල යොදා ඇත.

**39.** පහත ප්‍රකාශ ජල සම්පත පරිභෝජනය කිරීම හා සම්බන්ධ වේ. මින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) සියලුම ගෘහ අවශ්‍යතා සඳහා වැසි ජලය යෝග්‍ය වේ.
(2) පානීය ජලයෙහි සියලුම ක්ෂුද්‍රජීවීන් සහ රසායනික ද්‍රව්‍ය ඉවත් කර ඇත.
(3) පරිභෝජනය සඳහා සුදුසුවන්නේ පෘථිවි පෘෂ්ඨයේ ඇති ජලයෙන් 5% ක් පමණි.
(4) වැසි කාලය ආරම්භයේ සිටම වහලයට පතිතවන වැසි ජලය එකතු කර ගත යුතු ය.
(5) පරිභෝජනයට සුදුසු ජලයෙන් 70% ක් පමණ ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික කටයුතු සඳහා භාවිත කරනු ලැබේ.

**40.** පහත දක්වා ඇත්තේ විදුලිය සහ ජලය පිළිබඳ ප්‍රකාශ කිහිපයකි.

A - අනෙක් විදුලි පහන්වලට වඩා LED විදුලි පහන්වල ක්ෂමතාවය වැඩි නමුදු, ආයු කාලය අඩු ය.
B - සූර්ය කෝෂ භාවිතය, බලශක්ති අර්බුදයට පිළියමක් වේ.
C - සේදුම් කාරක, තෙල් සහ මේද අඩංගු ජලය පූතික ටැංකියට යොමු කිරීම නුසුදුසු ය.
D - මුළුතැන්ගෙයි භාවිත කළ ජලය ගෙවතු වගාව සඳහා සුදුසු නැත.

මින් නිවැරදි ප්‍රකාශ වන්නේ,

(1) A සහ B පමණි. (2) A සහ D පමණි. (3) B සහ C පමණි.
(4) B සහ D පමණි. (5) C සහ D පමණි.

**41.** පුනර්ජනනීය සම්පත්වල ලක්ෂණයක් **නොවන්නේ** මින් කුමක් ද?

(1) කෙටි කාලයක් තුළ ජනනය වීම
(2) ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි වීම
(3) ස්වාභාවිකව ජනනයවීමේ හැකියාව
(4) සම්පූර්ණයෙන්ම විනාශ කළ නොහැකි වීම
(5) ස්වාභාවික ක්‍රියාවලීන් මගින් ප්‍රතිස්ථාපනය කළ හැකි වීම

**42.** තිරසාර සම්පත් පරිභෝජනය කෙරෙහි ධනාත්මකව බලපාන කරුණ කුමක් ද?

(1) උපරිම නිෂ්පාදනයක නියැලීම
(2) කාබනික ගොවිතැනට යොමු වීම
(3) ගෑස් වෙනුවට ඉන්ධනයක් ලෙස දර භාවිත කිරීම
(4) මසකට පමණ අවශ්‍ය ආහාර රැස්කර තබා ගැනීම
(5) ගෘහීය කැළි කසළ ගෙවත්තෙහි වළකට බැහැර කිරීම

**43.** ආහාර පා සළකුණු අගය වැඩිවන සේ පෙළගස්වා ඇති ආහාර ඇතුළත් වරණය කුමක් ද?

(1) කිරි, පලතුරු සහ පාන් (2) බීම, ධාන්‍ය සහ එළවළු
(3) කුකුළු මස්, කිරි සහ සීනි (4) එළවළු, ධාන්‍ය සහ බීම
(5) සීනි, පලතුරු සහ කුකුළු මස්

**44.** ක්‍රියාකාරී ආහාර හා ඒවායේ අඩංගු ජෛව ක්‍රියාකාරී සංයෝග පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - ක්‍රියාකාරී ආහාර ලබාගැනීම සඳහා සමහරවිට ආහාරවලට නව සංයෝග එකතු කරනු ලැබේ.

B - ප්‍රිබයොටික්, ජීරණ පද්ධතිය තුළ හානිදායක බැක්ටීරියා වැඩීම වළක්වයි.

C - ඇමයිනෝ අම්ල සහ ප්‍රතිඔක්සිකාරක ආහාරවල ඇති බහුල ජෛව ක්‍රියාකාරී සංඝටක දෙකකි.

D - සැමවිටම ජාන විකරණය මගින් ආහාරවල ජෛව ක්‍රියාකාරී සංයෝග නිපදවනු ලැබේ.

මින් නිවැරදි ප්‍රකාශ වන්නේ,

(1) A සහ B පමණි. (2) A සහ C පමණි. (3) A සහ D පමණි.
(4) B සහ C පමණි. (5) C සහ D පමණි.

**45.** යොවුන්වියට සුවිශේෂී වූ ලක්ෂණය වන්නේ මින් කුමක් ද?

(1) ස්වාධීන වීමට උත්සාහ දැරීම
(2) හුදෙකලා වීමට ලැදියාවක් දැක්වීම
(3) සදාචාර සංවර්ධනයේ පසුබෑමක් ප්‍රදර්ශනය කිරීම
(4) තමා අන් අයට වඩා උසස්ය යන හැඟීමෙන් ක්‍රියා කිරීම
(5) කායික, චිත්තවේගීය හා බුද්ධිමය වශයෙන් පරිණතිය වැඩි වීම

**46.** නව යොවුන් විය, වයස අවු. 13 සිට 18 දක්වා බවට අර්ථකථනය කළ මනෝවිද්‍යාඥයා වන්නේ,

(1) ගෙසල් ය. (2) ස්ටොට් ය. (3) හර්ලොක් ය.
(4) ජීන් පියාජේ ය. (5) සිග්මන් ප්‍රොයිඩ් ය.

**47.** පවුල් තුළ දක්නට ලැබෙන ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

A - පවුලේ දෛනික කාර්යයන්ට සහභාගි වීමට දරුවාට අවස්ථාව ලබාදීම

B - දෙමවුපියන්ගේ අභිලාෂය අනුව නීති රීති පැනවීම

C - ගැටළුමය අවස්ථාවලදී දරුවාට මඟපෙන්වීම

D - සහෝදර සහෝදරියන් අතර තරඟකාරී ස්වභාවය

මින් දරුවන් තුළ ආත්ම අභිමානය ඉහළ නැංවීමට සහාය වන ගතිලක්ෂණ වන්නේ,

(1) A සහ B පමණි. (2) A සහ C පමණි. (3) A සහ D පමණි.
(4) B සහ C පමණි. (5) C සහ D පමණි.

**48.** මානසික පීඩනයකට ලක් වූ යෞවනයකු පිළිබිඹු කරන ප්‍රජානන ලක්ෂණයක් වන්නේ,

(1) අලස බවින් යුතුව ක්‍රියා කිරීම ය.
(2) තමා වරදකරුවකු යැයි සිතීම ය.
(3) අන් අය සමග ඇසුරට මැලිවීම ය.
(4) පොදු අවස්ථාවන්හිදී ප්‍රතිචාර නොදැක්වීම ය.
(5) විෂය කරුණු මතක තබා ගැනීමේ දුර්වලතා පෙන්වීම ය.

**49.** නිෂ්පාදනවල තත්වපාලනය පිළිබඳව ඉදිරිපත් කළ කරුණු කිහිපයක් පහත දැක්වේ.

A - මහා පරිමාණ නිෂ්පාදන සඳහා SLS සහතිකය ලබා ගැනීම අනිවාර්ය කර ඇත.

B - ව්‍යාපාරයක් තුළ සමාජ වගකීම් හා සමාජ ආචාර ධර්ම පිළිබඳව අවධාරණය කළ යුතු වේ.

C - ව්‍යවසායකයාගේ අභිමතය පරිදි ලේබල්කරණය තීරණය කළ හැකි ය.

D - ඇසුරුම් ද්‍රව්‍යවල ස්වභාවය මත නිෂ්පාදන ගබඩා කිරීම තීරණය කළ යුතු ය.

මින් නිවැරදි කරුණ/කරුණු වන්නේ,

(1) A පමණි. (2) B පමණි. (3) A සහ D පමණි.
(4) B සහ C පමණි. (5) C සහ D පමණි.

**50.** සුළු පරිමාණ ව්‍යාපාරයක් සැලසුම් කිරීමේදී, අවධාරණය කළ යුතු කරුණක් වන්නේ,

(1) ඉහළ ඉලක්ක පිහිටුවා ගැනීම ය.
(2) සාර්ථක ව්‍යාපාරයක් අනුගමනය කිරීම ය.
(3) පංච විධ සංකල්පය (5S) පමණක් භාවිත කිරීම ය.
(4) ව්‍යාපාරයෙහි සාර්ථකත්වය මත නව නිෂ්පාදනවලට යොමුවීම ය.
(5) මූල්‍යමය යෙදවුම් වැඩි කිරීමෙන් පමණක් ඵලදායීතාවය ඉහළ නැංවීම ය.

***

11963

AL/2020/28/S-II(NEW)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

(නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus)

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

ගෘහ ආර්ථික විද්‍යාව II
மனைப் பொருளியல் II
Home Economics II

28 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**

✳ **පළමුවන** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **හයකට** පිළිතුරු සපයන්න.

**1.** (i) නිර්මාණකරණයේ මූලධර්මයක් වන 'සමෝධානය' යනුවෙන් කුමක් අදහස් වේ ද?

(ii) ජලයේ යෝග්‍යතාව පරීක්ෂා කිරීම සඳහා සිදුකරන භෞතික පරීක්ෂණ **දෙකක්** නම් කරන්න.

(iii) ලිපිඩ හඳුනාගැනීම සඳහා භාවිත කරන රසායනික පරීක්ෂාවක් නම්කර එය සිදු කරන ආකාරය කෙටියෙන් ලියන්න.

(iv) අයඩින් ඌනතාවයේ රෝග ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.

(v) ගොතන ලද රෙදි සකස් කිරීමේදී භාවිත වන ගෙතීමේ ආකාර **දෙකක්** සඳහන් කර උදාහරණය බැගින් දෙන්න.

(vi) බතික් කිරීමේදී තද පැහැයක් ලබාගැනීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග **දෙකක්** දක්වන්න.

(vii) සංචාරක කර්මාන්තයට සහය ලබාදෙන උපකාරක සේවා **දෙකක්** සඳහන් කර, ඒ එකිනෙකින් ඉටුවන කාර්යය බැගින් ලියන්න.

(viii) ජෛව විවිධත්වය යන්නෙන් අදහස් වන්නේ කුමක් ද? ඉන් ඇතිවන වාසියක් සඳහන් කරන්න.

(ix) ක්‍රියාශීලී විවේකයේ ක්‍රියාකාරකම් කාණ්ඩ **දෙකක්** ලියා උදාහරණය බැගින් දෙන්න.

(x) යෞවනයකු තුළ හීනමානය ඇති කිරීමට හේතුවිය හැකි කරුණු **දෙකක්** ලියන්න. (ලකුණු 02 × 10 යි.)

(මුළු ලකුණු 20 යි.)

**2.** (i) ගොඩනැගිලි හා බාහිර පරිසර නිර්මාණකරණයේදී සලකා බැලිය යුතු 'අනුකූලත්වය' අර්ථ දක්වන්න. (ලකුණු 02 යි.)

(ii) නිවසකට ගෘහභාණ්ඩ තෝරා ගැනීමේදී සලකා බැලිය යුතු කරුණු **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි.)

(iii) පහත සඳහන් ගෘහ විද්‍යුත් උපකරණවල ක්‍රියාකාරීත්වය හා ඒවා නඩත්තු කළයුතු ආකාරය පැහැදිලි කරන්න.

- විදුලි ඉස්ත්‍රික්කය
- බ්ලෙන්ඩරය

(ලකුණු 05 යි.)

(iv) ගෘහස්ථ ජල සැපයුම් පද්ධතිය දළ රූප සටහනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)

(මුළු ලකුණු 16 යි.)

**3.** (i) මේද අම්ලවල ව්‍යුහය අනුව බෙදා දැක්විය හැකි ප්‍රධාන ආකාර **දෙකක්** නම් කර ඒ එක එකක් සඳහා උදාහරණයක් බැගින් දෙන්න. (ලකුණු 03 යි.)

(ii) මාස 6 සිට අවුරුද්ද දක්වා දරුවකු ඝන ආහාරවලට හුරු කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු **හතරක්** ලියන්න. (ලකුණු 04 යි.)

(iii) උදැසන ආහාරය ලෙස ඉඳිආප්ප, පොල් සම්බලයක්, මාළු කෑල්ලක් සමග පලතුරු යුෂ වීදුරුවක් ලබාගත් පාසල් සිසුවකුගේ ආමාශය තුළ සිදුවන ජීරණ ක්‍රියාවලිය සැකෙවින් ලියන්න. (ලකුණු 04 යි.)

(iv) ආමාශයික ප්‍රදාහයෙන් පෙළෙන පුද්ගලයකු සඳහා දිනක බොජුන්පතක් සැලසුම් කරන්න. (ලකුණු 05 යි.)

(මුළු ලකුණු 16 යි.)

[දෙවැනි පිටුව බලන්න.

**4.** (i) ආහාර ඇසුරුම තුළ වාතයේ සංයුතිය වෙනස් කිරීම මගින් (modified atmosphere packaging) පරිරක්ෂණය කළ ආහාර වර්ග **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි.)

(ii) ආහාර පරිරක්ෂණයේදී පිටත ඝන ස්තරයක් (case hardening) ඇතිවීම සිදුවන අයුරු දක්වා, එම තත්ත්වය වළක්වා ගැනීමට ගතහැකි පියවර ලියන්න. (ලකුණු 04 යි.)

(iii) දුම් ගැසීම මගින් මාළු පරිරක්ෂණය කරන අන්දම විස්තර කරන්න. (ලකුණු 04 යි.)

(iv) දුම් ගැසූ මාළු නිෂ්පාදනයක් සුළු පරිමාණ ව්‍යාපාරයක් ලෙස ආරම්භ කිරීමට ව්‍යවසායකයකු අදහස් කරයි. ඒ සඳහා තත්ත්ව පාලනයේදී අනුගමනය කළයුතු මනා කළමනාකරණ උපක්‍රම (GMP) දක්වන්න. (ලකුණු 06 යි.)

(මුළු ලකුණු 16 යි.)

**5.** (i) ශ්‍රී ලංකාවේ ඇඟලුම් කර්මාන්තයට ඇතිවිය හැකි අභියෝගවලට විසඳුම් **තුනක්** ඉදිරිපත් කරන්න. (ලකුණු 03 යි.)

(ii) ඇඟලුම් කර්මාන්තයේදී කැපීම සඳහා භාවිත වන විවිධාකාර කැපුම් උපකරණ **තුනක්** සඳහන් කර එම උපකරණ ක්‍රියාකරන ආකාරය දක්වන්න. (ලකුණු 03 යි.)

(iii) රෙදිවල තත්ත්ව පරීක්ෂාවේදී සලකා බලන තත්ත්ව **හතරක්** පැහැදිලි කරන්න. (ලකුණු 04 යි.)

(iv) රවුම් මේසයකට මේස රෙද්දක් මසා නිමකිරීම සඳහා අවශ්‍ය මිනුම් පහත දක්වා ඇත.

මේසයේ විශ්කම්භය - 120 cm

මේසයේ අද්දරින් පහළට වැටෙන ප්‍රමාණය - 30 cm

(a) මෙම මේස රෙද්ද කපා, මසා ගැනීමට අවශ්‍ය රෙදි ප්‍රමාණය ගණනය කර, එය දළ රූප සටහනකින් ඉදිරිපත් කරන්න.

(b) මේස රෙද්ද අද්දරට විසිතුරු රේන්දයක් අල්ලා එය මසා නිම කිරීමට අනුගමනය කළයුතු පියවර ලියන්න. (ලකුණු 06 යි.)

(මුළු ලකුණු 16 යි.)

**6.** (i) 'ඉවැසි හරිතාගාර ආවරණය' යනුවෙන් කුමක් අදහස්වේ ද? (ලකුණු 02 යි.)

(ii) දේශගුණික විපර්යාස කෘෂිකර්මාන්තයට බලපාන අයුරු විස්තර කරන්න. (ලකුණු 04 යි.)

(iii) විකල්ප සංචරණයේ ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 04 යි.)

(iv) සංචරණය ශ්‍රී ලාංකික සමාජ-සංස්කෘතියට වාසිදායක ලෙස බලපාන අයුරු සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි.)

(මුළු ලකුණු 16 යි.)

**7.** (i) පුද්ගලයකුගේ පෞරුෂ වර්ධනය කෙරෙහි බලපාන ජීවවිද්‍යාත්මක සාධක **තුනක්** ලියන්න. (ලකුණු 03 යි.)

(ii) සමාජ සබඳතා ගොඩනගා ගැනීමේදී යෞවනයින් පෙන්වන ලක්ෂණ **තුනක්** ඉදිරිපත් කරන්න. (ලකුණු 03 යි.)

(iii) මානසික නිරෝගීතාව යෞවනයාට වැදගත්වන අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)

(iv) 'සන්නිවේදන මාධ්‍ය යෞවනයින් තුළ ගැටලු ඇති කිරීමට හේතුවිය හැකි ය.' විමසන්න. (ලකුණු 05 යි.)

(මුළු ලකුණු 16 යි.)

**8.** පහත දැක්වෙන මාතෘකා අතුරෙන් **හතරක්** පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) ජීවන පරිසර නිර්මාණය කෙරෙහි මිනිසා යොමුවීමට හේතු

(ii) ජාතික පෝෂණ ප්‍රතිපත්තියේ වැදගත්කම

(iii) කෙටි කෙඳි භාවිතයෙන් නූල් නිෂ්පාදනයේ පියවර

(iv) වර්තමානයේදී සංචාරකයින් වැඩි වශයෙන් සෞඛ්‍ය සංචරණයට යොමුවීමට හේතු

(v) සමබර පෞරුෂ සංවර්ධනය කෙරෙහි වැදගත්වන අංශ (ලකුණු 04 × 4 යි.)

(මුළු ලකුණු 16 යි.)

***

More Past Papers at
tamilguru.lk